


# මී පැනි පෙදෙස - ආදිවාසී නාට්‍යයක්



**1788 දී මෙහි සම්ප්‍රාප්ත වූ සුදු ජාතීන් විසින් ආදිවාසීන්ගේ දේශය තමා සතු බූදලය හැටියට ප්‍රකාශයට පත්කිරීමට අගේ ඇති මන්තරයක් නොහොත් සූත්‍රයක් ද නිර්මාණය කර ගන්නා ලදී.**
**"හිමිකරුවන් රහිත බිම" යන අදහස රැගත් TERRA NULIOS යන ලතින් පාඨය ඔවුන්ගේ පිළිසරණ වූයේ ය.**

තරංග දන්දෙණිය විසින් සිංහලට නගන ලද ආදිවාසී කවියකු වූ ජැක් ඩේවිස් ගේ Honey Spot නම් කෘතිය කියවන මා සිතට නැගුණු අදහස් කිහිපයක් ඉදිරිපත් කළ යුතු යයි මම කල්පනා කරමි. මේ වසරේ දී මා පළ කළ " ඉර හඳ තරු බිහිවුණු සුපින සමය" නමින් වූ ආදිවාසී පුරාවෘත සිංහලෙන් ලිවීමේදී ද මට මේ කියන අදහස් මතු කළෙමි. එනම් මෙබඳු මහ දූවකට අවුත් අප විඳින සැප සම්පත් ලැබීමට පවා පින් නොකළ (ඒ අපට පුරුදු දහමට අනුව කියන කතාවකි) සිය ජන්ම උරුමය සපුරා භුක්ති විඳීමට අවසර නොලත් මෙරට මුල් පදිංචිකරුවන් වූ ජනවර්ගයා ගැන අප දක්වන ආකල්ප සහ උනන්දුව ගැන කියා ඇති හොඳම විනිශ්චය මා දුටුවේ ඉන්දුනීසියානු ලේඛිකාවක වූ රතී ෆාර්ද්යෝනෝ ලියූ ආසියාවේ සුදු ගෝත්‍රය White Tribe of Asia නම් වූ පොතෙහිය. ඇගේ ප්‍රකාශය එක අතකින් චෝදනාවකි.

"ඕස්ට්‍රේලියානු ආදි වාසී ජනතාවගේ අද තත්වය එසේම පැවතීම පිළිබඳ වගකීම සුදු ඕස්ට්‍රේලියානුවන්ටම පවරා නිහඬවීම මෙහි පැමිණි අනෙකුත් සංක්‍රමණිකයන්ට සුදුසු නොවන්නකි"

අධ්‍යාපනයට ඇති අවස්ථා සහ රැකියා පහසුකම් අතින් පමණක් නොව මූලික මිනිස් අයිතිවාසිකම් වශයෙන් ගත යුතු නිවාස - සෞඛ්‍ය හා ජීවන පහසුකම් පවා ඔවුනට හරි හැටි නොලැබෙන බව අපද දත යුතු බව අවධාරණය කළ යුත්තේ අප විඳින සැප පහසුව අපට ලැබුනුයේ වසර පනස් දහසකට ආසන්න කාලයක් ඔවුන් විසින් රැක බලා ගන්නා ලද - ආරක්ෂා කරන ලද මේ මහ දූවේ සැප සම්පත් නිසා බව අප අමතක නොකළ යුතු හෙයිනි.

1788 දී මෙහි සම්ප්‍රාප්ත වූ සුදු ජාතීන් විසින් ආදිවාසීන්ගේ දේශය තමා සතු බූදලය හැටියට ප්‍රකාශයට පත්කිරීමට අගේ ඇති මන්තරයක් නොහොත් සූත්‍රයක් ද නිර්මාණය කර ගන්නා ලදී. "හිමිකරුවන් රහිත බිම" යන අදහස රැගත් TERRA NULIOS යන ලතින් පාඨය ඔවුන්ගේ පිළිසරණ වූයේ ය. ඒ පාඨයේ තෙදබල කොතරම් වී ද යත් 1967 ජනමත විචාරණය අනුව මෙහි පුරවැසියන් හැටිය පිළිගන්නා තෙක්ම තමන් උපත ලත් - තමා රැකගත් - තමාගේම රටේ පිටගම්කාරයන් බවට පත්ව විසූ බව දන්නා අය අතර විරල යයි සිතමි.

දේශය රැක බලා ගැනීම ගැන මා පවසන අදහස මගේ නිර්මාණයක් නොව - THE BIGGEST ESTATE ON EARTH - ලෝකයේ ලොකුම වත්ත යන නමින් බිල් ගැමේජ් නම් මහාචාර්යවරයා ගියූ පොතෙහි පුන පුනා දක්වනු ලබන අදහස ය.

ක්‍රිස්තුස්වහන්සේගේ දහම උගන්වන්නට පවා නුසුදුසු පහත් ජනතාවක් ලෙසට නිව් සවුත් වේල්සයට පැමිණි මාර්ස්ඩන් නම් පූජකවරයා හෙළා දුටු කලු ජාතික ඕසට්‍රේලියානුවා සතු ඉපැරණි සංස්කෘතිය ගැන ලියූ සුදු ඕස්ට්‍රේලියානුවන් අතර හෙන්රි රෙනල්ඩ් නම් මහාචාර්යවරයා වැනි කිහිප දෙනෙක් ම සිටිති.

මෙබඳු විස්තරයක් මගේ ලිපියට පෙරවදනක් හැටියට ලිවීමට මා හිතුවේ තරංග දන්දෙණිය විසින් සිංහලට නගන ලද නාට්‍යයද බිමේ අයිතිය පිළිබඳ ගැටුමක් රැගත් නිමැවුමක් වන හෙයිනි.

වනාරක්ෂක දෙපාර්තමේන්තුවට අයත් නිවසක් කුලියට ගෙන වාසය කරන ආදිවාසී පවුලක දරුවන් කිහිපයක් වටා ගෙතී ඇති මේ නාට්‍යය වුවද අපට තමන්ගේ ඉඩම අල්ලා ගත් පිට දේශක්කාරයන්ගේ අතවරවලට ලක්වන අසරණයන්ගේ කතන්දරම ය.

ඩිගිරිඩූ නම් වූ සංගීත භාණ්ඩය තැනීම සඳහා කපා ගත් ලී දඬු නිසා නීතියේ රැහැනට අසුවන්නට යන තරුණයාට වනාරක්ෂක නිලධාරියා තරවටුවක් කරයි.

"උඹලා හොඳටම වාසනාවන්තයි. වනාරක්ෂක දෙපාර්තමේන්තුව මේ ගෙදර උඹලාට කුලියට දීලා තියෙන හින්දා. මම උඹට අනතුරු අඟවලයි තියෙන්නේ. මොනවා හරි නෙලා තිබ්බොත්"

විලියම් නම් තරුණයාගේ ප්‍රතාචාරය ඊට දෙවැනි නොවන්නකි.

"මගේ මිනිස්සු මෙහේ අවුරුදු හතළිස්දාහක් විතර ජීවත්වුණා. ඔහේලගෙ කට්ටිය මෙහාට එන්ඩ කලියෙන්. ඔබලා මෝ පොළොව අපෙන් අරගත්තේ. දැන් මගෙන් බලාපොරොත්තු වෙනවා කෘතඥ වෙයි කියලා. අපි මෙහේ ජීවත් වුණා ශත වර්ෂ ගණනාවක්. අපිට ඕනෑ වුණේ නැහැ නීති රීති එක එක දේවල් රැක ගන්ඩ. අඩුගානේ අපි අපිවත්"

නිලධාරියා මෙහෙම කියා තම මතය තහවුරු කිරීමට බලයි.

"සමහරවිට නොවෙන්ඩ පුලුවන්.. ඒත් දැන් කාලෙ වෙනස් වෙලා"

විලියම්ගේ චෝදනාව සමස්ථ ආදිවාසී ජනතාව වෙනුවෙන් කරන්නකි.

"කාලෙ කිසි දෙයක් වෙනස් කරන්නෙ නැහැ කැලෑ මහත්තයෝ.. මිනිස්සු විතරයි. ඔහේලගෙ හම තියෙන මිනිස්සුයි. මේ භූමිය වෙනස් කෙරුණේ මමවත් මගේ අයවත් නෙවෙයි"

අග්‍රාමාත්‍ය උපදේශක වශයෙන් ආදිවාසියකු තබාගෙන රට රවටන අගමැතිවරුන් පවා මේ පිළිබඳ යථාවබෝ ධය ලද්දන් නොවන බවයි මට පෙනෙන්නේ. ඒ අවබෝධය පොතක් කියවා ලබන්නක් ද නොවේ. ආදි වාසී ජනතාව සමග ගැටෙමින් - ඔවුන් සතු චාරිත්‍ර වාරිත්‍ර සහ සම්මත පිළිබඳ හැදෑරීමකින් පමණක් ලද හැකි අවබෝධයකි.

ලොරි ඕක් නම් රූපවාහිනී නිවේදකයා වරක් ජෝන් හොවාර්ඩ් අගමැතිගෙන් ඇසූ ප්‍රශ්නයක් මට මතකය.

"ඔබ කී වතාවක් දිවා භෝජනය සඳහා ආදිවාසියකු ඔබේ නිවසට කැඳවා තිබේද?"

අගමැතිවරයාට කට උත්තර නොතිබුණු බව කිවයුතු නොවේ. ලිබරල් කම්කරු පක්ෂ දෙකින්ම නායකත්වයට මේ ප්‍රශ්නය දිය හැකි පිළිතුර එකම බවද සිතිය හැකිය.

2000 දී පළවූ මගේ "සංගම් කාරයාගේ මළගම" කෙටිකතා එකතුවට ආදිවාසීන් ගැන ලියන ලද කතා දෙකක් ඇත-ළත් කළ මම මගේ පිලි එකතු දෙකකටම ඒ ප්‍රශ්නය පිළිබඳව ලිපි ඇතුළත් කළෙමි. මා මේ දක්වා හිතාගෙන හිටියේ අප සිංහල ලේඛකයකු ආදිවාසීන් ගැන නොලියූ බව ය. මම ඒ පිළිබඳ ගෞරවය තරංගය දීමටද පසුබට නොවෙමි.

ආදිවාසීන්ගේ දිවිය ගැන කවි ලියූ අපේ කවියන් දෙදෙනා ගැන ද මම කිහිප වතාවක්ම ලියුවෙමි. සිඩ්නිවාසී ලක්ෂ්මන් කොඩිතුවක්කු සහ පර්ත්වාසී සුනිල් ගොවින්න යන දෙදෙනා ගැන ය. තවත් අපගේ ලේඛකයන්ගේ අවධානය ඔවුන්ගේ දිවිය වෙත යොමු වේවායි පතමි.

Land for Sale
**Gampaha**
Quiet residential area in 47 Perches of land
with a old house off Church Road.
7 minutes to town.
Valued only for land Rs. 700,000 per Perch .
call : 0435879888 or
email : wskper56@gmail.com